# සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය
# நலன்புரி நன்மைகள் சபை
# WELFARE BENEFITS BOARD

මුදල්, ආර්ථික සංවර්ධන, ප්‍රතිපත්ති සම්පාදන, සැලසුම් සහ සංචාරක අමාත්‍යාංශය
நிதி, பொருளாதார அபிவிருத்தி, கொள்கை வகுத்தல், திட்டமிடல் மற்றும் சுற்றுலாத்துறை அமைச்சு
MINISTRY OF FINANCE, ECONOMIC DEVELOPMENT, POLICY FORMULATION, PLANNING AND TOURISM
ජේ.ආර්. ජයවර්ධන මධ්‍යස්ථානය, නො.191, ධර්මපාල මාවත, කොළඹ 07 | ஜே ஆர் ஜெயவர்தன மையம், 191, தர்மபால மாவத்தை, கொழும்பு 7
J.R. Jayewardene Center, No.191, Dharmapala Mawatha, Colombo 07


| | | | | | |
|---|---|---|---|---|---|
| මාගේ අංකය<br>எனது இல<br>My No. | WBB/Notice/D/Div/2024 | ඔබගේ අංකය<br>உனது இல<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2024.11. 18 |

Circular No - 25/2024

සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්/නියෝජ්‍ය සුබසාධක ප්‍රතිලාභ කොමසාරිස් වරුන්,

**<u>අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ ගෙවීමේ යෝජනා ක්‍රමය යටතේ පළමු වටයේ ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ දී අගතියට පත් තැනැත්තන් සඳහා දුක්ගැනවිලි ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම</u>**

අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ ගෙවීමේ යෝජනා ක්‍රමය යටතේ පළමු වටයේ අයදුම්පත් කැඳවා මූලික වශයෙන් ප්‍රතිලාභීන් තෝරා ගැනීමෙන් පසුව අභියාචනා හා විරෝධතා ඉදිරිපත් කිරීමට නිශ්චිත කාලයක් ලබා දී තිබුණි. ඒ අනුව ඉදිරිපත් වූ අභියාචනා හා විරෝධතා අතුරින් ඉතාමත් සුළු සංඛ්‍යාවක් හැරුණු විට අනෙක් සියල්ලම පරීක්ෂාවට ලක් කර තීරණ ලබා දී ඇත. ඒ අනුව සුදුසුකම් ලැබූ පවුල් ලක්ෂ 18ක ප්‍රමාණයෙන් පවුල් ලක්ෂ 17කට ආසන්න ප්‍රමාණයක් සඳහා මේ වන විට මාසික ප්‍රතිලාභ මුදල් ගෙවීමට පියවර ගෙන ඇත. ඉතිරි පවුල් ලක්ෂයක පමණ ප්‍රමාණයක් සඳහා ප්‍රතිලාභ ගෙවීමට නොහැකිව පවතින විවිධ ගැටළු විසඳීම සඳහා දැනට පියවර ගනිමින් තිබේ.

මෙම ප්‍රතිලාභ සඳහා තෝරා ගැනීමේ ක්‍රියාවලිය තුලින් අගතියට පත්ව ඇතැයි සලකන පුද්ගලයින් විසින් නිරන්තරයෙන් මෙම මණ්ඩලය වෙත මෙන්ම ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත විමසීම් ඉදිරිපත් කරනු ලැබේ. එවැනි දුක්ගැනවිලි විසඳීම සඳහා දැනට දුක්ගැනවිලි විසඳීමේ යාන්ත්‍රණයක් හඳුන්වා දී ඇත.

මෙමගින් දුක්ගැනවිලි ඉදිරිපත් කිරීමට විශේෂ අවස්ථාවක් ලබාදී ඒවාට විසඳුම් ලබාදීමේ විශේෂ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට රජය තීරණය කර ඇත.

එබැවින් එවැනි දුක්ගැනවිලි ඉදිරිපත් කිරීම සඳහා 2024.11.25 දින සිට 2024.12.15 දින දක්වා කාලය ප්‍රකාශයට පත් කරනු ලැබේ. මෙම කාලය තුළ දී පළමු වටයේ අයදුම් කරන ලද අයදුම්කරුවන්ගේ දුක්ගැනවිලි මේ සමඟ අමුණා ඇති ආකෘතිය ප්‍රකාරව සම්පූර්ණ කර ඉදිරිපත් කළ යුතු ය. ඒ අනුව මෙම ආකෘතියට අනුව අවශ්‍ය පිටපත් මුද්‍රණය කර ගෙන අවශ්‍ය තැනැත්තන් වෙත සුදුසු ක්‍රමවේදයක් යටතේ නිකුත් කිරීමටත් අදාළ කාලය තුළ දී සම්පූර්ණ කරන ලද අයදුම්පත් භාර ගැනීමටත් අවශ්‍ය පියවර ගන්න.

මෙසේ ලබා ගන්නා අයදුම්පත් පහත සඳහන් ආකාරයට වර්ගීකරණය කර අනතුරුව ඒවා ග්‍රාම නිලධාරි වසම් අනුව ද වර්ගීකරණය කර වෙන වෙනම භෞතික වශයෙන් ගොනු කර තබා ගන්නා ලෙස කාරුණිකව දන්වමි.


කාර්යාලය / அலுவலகம் } Tel: 009411-2151481, 009411-2484600/4117
විද්‍යුත් තැපැල / மின்னஞ்சல் } welfarebenefitboard2016@gmail.com
වෙබ් අඩවිය / இணையதளம் } www.wbb.gov.lk

විෂය අනුව දුක්ගැනවිලි වර්ගීකරණය -

I. අයදුම්පත් කැඳවීමේදී අගතියට/ අසතුටට පත්වීම
II. නිවාස වෙත පැමිණ තොරතුරු රැස් කිරීමේදී අගතියට/ අසතුටට පත්වීම
III. තෝරා ගැනීමේ ක්‍රමවේදය සම්පන්ධව අගතියට/ අසතුටට පත්වීම
IV. වෙනත් කරුණක් අගතියට/ අසතුටට පත්වීම

මෙම අයදුම්පත් කැඳවීම සම්බන්ධයෙන් සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය මගින් ජාතික මාධ්‍ය හරහා පුළුල් ප්‍රචාරයක් ලබාදීමට පියවර ගන්නා අතර ප්‍රාදේශීය වශයෙන් ප්‍රචාරයක් ලබාදීමට අවශ්‍ය පියවර ගන්නා මෙන් ද දන්වමි.

එමෙන්ම අවශ්‍ය තැනැත්තන්ට පලමුවටයේදී තමා විසින් අයදුම්පත් සමග සහ සංගණන අවස්ථාවේදී ඉදිරිපත් කරන ලද තොරතුරු IWMS පද්ධතිය තුළින් පරික්ෂා කිරීමට හැකියාව ඇත. ඒ සඳහා තම ජාතික හැදුනුම්පත් අංකය හෝ HH අංකය ඇතුළත් කර එම තොරතුරු බලා ගන්නා ආකාරය අවශ්‍ය අවස්ථාවල දී පැහැදිළි කර දිය යුතුයි. අයදුම්පත් භාරගැනීමේදී එම අයදුම්පතේ අග ඇති කොටස සම්පූර්ණ කර රිසිට්පතක් ලෙස අයදුම්කරුට නිකුත් කිරීමටත් අයදුම්පත් ලියාපදිංචි කිරීමේ ලේඛනයක් භෞතිකව පවත්වාගෙන යාමටත් WIUB නිලධාරීන් වෙත උපදෙස් ලබාදෙන මෙන් දන්වමි.

මෙසේ ලබා ගන්නා දුක්ගැනවිලි අයදුම්පත් සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදුකරන ආකාරය පිලිබඳව උපදෙස් පසුව නිකුත් කරනු ලැබේ.

මේ සම්බන්ධයෙන් ඔබ විසින් ලබාදෙන සහාය අගය කරමි.

ජයන්ත විජේරත්න
සභාපති/කොමසාරිස්

පිටපත් : 01. ලේකම්, මුදල්, ආර්ථික සංවර්ධන, ප්‍රතිපත්ති සම්පාදන සැලසුම් හා සංචාරක අමාත්‍යාංශය
02. ලේකම්, අධිකරණ, රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු පළාත් සභා, පළාත් පාලන සහ කම්කරු අමාත්‍යාංශය
03. සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්/අතිරේක සුබසාධක ප්‍රතිලාභ කොමසාරිස් වරුන් - අවශ්‍ය සම්බණ්ධීකරණ ය හා මෙහෙයුම් කටයුතු සඳහා